**සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - 2018**

---------------------------------------------------

**තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ( "සමාගම") සහ සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන් හි ( "සමූහය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1 ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

**(කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර)**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය වියදම්වලට අදාළ තත්‍ය මුදල් ගලා යාම රු.74,168,000 ක් විය. කෙසේවුවද, එය රු. 75,486,000 ක් ලෙස වාර්තා කර තිබුණි .එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල 7.14 වගන්තියට පටහැනිව රු.1,318,000කින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි . | ලබන වසරේ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතුවේ. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල 17.19 වගන්තිය පරිදි ,රු.1,182,000,000 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල | ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීම සහ සැසඳීම් කෙරෙමින් පවතින අතර බීඩීඕ උපදේශක පුද්ගලික සමාගම විසින් සිදුකර ඇත. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් උපයෝජනය කරනවිට, ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය කළයුතු අතර ගිණුම් නැවත ප්‍රකාශ කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ආර්ථිකමය ජීවකාලය සමාලෝචනය කිරීමකින් තොරව සමාගම විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි. | 28.19 වගන්තියේ අවශ්‍යතාවය පරිදි, නිශ්චිත ප්‍රතිලාභ වගකීම් මැනීමේදී, සමාගම සරල ක්‍රමය භාවිතා කර තිබුණි. | ප්‍රමිතිය ප්‍රකාරව එවැනි වගකීම් ඒවයේ වර්තමාන අගයට මැනිය යුතුය. |
| (ඇ)ප්‍රමිතියේ 28.15 (අ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි 2018 දෙසැම්බර් 31 දිනට වූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ වූ රු.583,746,000 ක වගකීම් වටිනාකම එහි වර්තමාන අගයට මිණුම් කර දක්වා නොතිබුණි. | | |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොග අයිතම් 06ට අදාළව ලෙජරයේ දක්වන ලද තොග ශේෂයේ සහ භෞතිකව සත්‍යාක්ෂණය කරන ලද තොග වටිනාකමේ රු.4,061,664 ක වෙනස්කම් නිරීක්ෂණය විය . | වෙනස්කම් සඳහා හේතු සැසඳුම් ක්‍රියාවලියේ දී හඳුනාගෙන ඇති අතර 2019 වර්ෂය තුළ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වෙනස්කම් නිවැරදි වෙන අයුරින් සැසඳුම් සකස් කළයුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට වූ වෙළඳ ණයගැති වටිනාකම රු.828,751,000 ක් විය.රු.635,362,202 ක් වටිනා ණයගැතියන් 679 ට ශේෂ තහවුරු කිරීමට යවා තිබුණ ද, රු.37,144,202 ක් වටිනා ණයගැතියන් 41 ක් හෙවත් ණයගැතියන් 679 න් සියයට 06 ක් පමණක් 2019 අප්‍රේල් 08 දින වනවිට ප්‍රතිචාර දක්වා තිබුණි. ප්‍රතිචාර දක්වන ලද ණයගැතියන් 41 දෙනාගෙන් රු.16,440,483 ක් වටිනා ණයගැතියන් 21 දෙනෙක් සමාගමේ ශේෂ සමඟ එකඟ වී තිබුණි. එකතුව රු.114,375,569 ක් වූ වෙළඳ ණයගැතියන් වසරකට වඩා හිඟ පැවතුණු අතර ඉන් රු.31,260,774 ක් අයකරගත නොහැකි සේ සලකා නීති අංශයට යොමුකර තිබුණි. | යවන ලද ශේෂ තහවුරු කිරීම් ලිපිවලට ප්‍රතිචාර (එකඟ වූ හෝ එකඟ නොවූ) දක්වා නොතිබුණ ද, 2018 දෙසැම්බර් 31 දිනට වූ බොහෝ හිඟ ශේෂයන් 24.04.2019 දින වන විට පියවා තිබුණි. | සමාගමේ වාර්තා එහි සේවාදායකයන්ගේ වාර්තා සමඟ සැසඳීමට පද්ධතියක් ඇතිකළ යුතුය. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට ග්‍රාහක මුදල් ගිණුමේ (subscription account) දැක්වුණු හිඟ ශේෂයේ අගය රු.8,279,137 ක් විය. ඉන් රු.4,006,615 ක් 2011 සිට 2015 ක් දක්වා කාල පරාසයක සිට හිඟව පැවතුණු අතර මෙම වටිනාකම වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බොල්ණය ප්‍රතිශතය අඩුකිරීම සඳහා රජයේ ආයතනවලට පමණක් ණය පහසුකම් ලබාදීමට 2017 වර්ෂයේදී පියවර ගෙන ඇත. | ග්‍රාහක මුදල් මත පුවත්පත් සැපයීමේදී, අයකරගැනීම් ද අධීක්ෂණය කළයුතුවේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 (1) වගන්තිය හෝ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 වගන්තිය (2018 අප්‍රේල් 01 සිට) සහ2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය. | 2018 අප්‍රේල් සිට 2019 මාර්තු දක්වා කාලපරිච්ඡේදය තුළ සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනා සඳහා උපයන විට ගෙවීම් බදු ලෙස රු.3,894,137 ක මුදලක් අදාළ සේවකයින්ගෙන් අඩුකර ගැනීමකින් තොරව සමාගම විසින් ගෙවා තිබුණි. | උපයන විට ගෙවීම් (PAYE) බදු ගණනය කර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව ප්‍රේෂණය කර ඇත. | උපයන විට ගෙවීම් බදු සේවකයින්ගෙන් අඩුකර අයිආර්ඩී වෙත ප්‍රේෂණය යුතුවේ. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1වගන්තිය. | සමාගම එහි බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාල අමාත්‍යාංශයේ අනුමැතිය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව ලබාගෙන නොතිබුණි. | ඒඑන්සීඑල් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට නොවැටෙන බැවින් යොමුගත චක්‍රලේඛය ඒඑන්සීඑල් සඳහා අදාළ නොවේ. | සමාගමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛවලින් බැහැරවීමට අවශ්‍ය නම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිර්දේශයක් ලබාගත යුතුවේ. |
| (ඇ) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගම රජයට අයත් ව්‍යවසායයක් බවට වර්ගීකරණය කර තිබුණද, මුදල් අමාත්‍යාංශයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද කිසිඳු නිර්දේශයක් මේ දක්වා අනුගමනය කර නොතිබුණි. කෙසේවුවද, පීඊඩී චක්‍රලේඛයන්ගෙන් බැහැරවීම සඳහා සමාගම කිසිඳු නිර්දේශයක් ලබාගෙන නොතිබුණි. | ඒඑන්සීඑල් උක්ත දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට නොවැටෙන බැවින් යොමුගත චක්‍රලේඛය ඒඑන්සීඑල් සඳහා අදාළ නොවේ. | සමාගමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛවලින් බැහැරවීමට අවශ්‍ය නම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිර්දේශයක් ලබාගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.4 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් කලාවේදීන් අට දෙනෙකු, කර්තෘවරු හතර දෙනෙකු, සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකු (කාර්මික), ඡායාරූප ශිල්පියෙකු, පෘෆ් කියවන්නෙකු, සහකාර කළමනාකාරවරයෙකු, සාමාන්‍ය සහකාරවරයෙකු සහ විධායකයෙකු ඇතුළත් නිලධාරින් දහඅට දෙනෙකු වෙනත් රජයේ ආයතනවල සේවයට මුදාහැර තිබුණු අතර ඔවුන්ගේ වැටුප්, වේතන හා දීමනා ලෙස රු.11,962,607 ක මුදලක් සමාගම විසින් වැය කර තිබුණි. තවද, පුවත්පත් කලාවේදීන් අටදෙනෙකු සහ කර්තෘවරු හතරදෙනෙකු මුදාහැරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ සමාගම පුවත්පත් කලාවේදීන් හතළිස් පස්දෙනෙකු සහ කර්තෘවරු විසිහත්දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | ඔවුන් වැටුප් සහිතව මුදාහැරීම කළමනාකණය අනුමත කර ඇත. | සමාගම 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 පිළිපැදිය යුතුවේ. |
| (ඉ) 1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය-මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය | 2018 දෙසැම්බර් 31 දිනවන විට අපහාස නඩු දහහතරක් සහ එක් බුද්ධිමය දේපල නඩුවක් බාහිර පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව ගොනු කර තිබුණි. සමාගමට එරෙහිව ගොනු කර තිබුණු අපහාස නඩු දෙකකින් පරාජයට පත්වීමෙන් පසුව රු.5,193,912 ක වටිනාකමක් සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ පැමිණිලිකරුවන්ට ගෙවා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | මාධ්‍යවේදීන් ආචාර ධර්ම පිළිපදින්නේ නම් අපහාස නඩු අඩුකර ගතහැකිවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.166,227,000 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.243,660,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.409,887,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුද්‍රණ ද්‍රව්‍යවල අධික මිල ගණන් හේතුවෙන් විකුණුම් පිරිවැය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

පසුගිය වර්ෂ හතර සහ සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමේ දී, 2014 සිට 2018 දක්වා අගය එකතුවීම උච්චාවචනය වී තිබුණි. කෙසේවුවද, සේවක වැටුප්, බදු හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු (ලාභාංශ සහ සාධාරණ අගය ගැළපීමට පෙර), පසුගිය වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී සියයට 13 ක අඩුවීමක් පෙන්නුම් කරමින් 2017 සහ 2018 වර්ෂ සඳහා අගය එකතුවීම පිළිවෙලින් රු.2,025,767,000 ක් සහ රු.1,756,556,000 ක් විය .

### 2.2 අනුපාත විශ්ලේෂණය

-----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ .

| | 2018 | 2017 |
|---|---|---|
| | ප්‍රතිශතය | ප්‍රතිශතය |
| දළ ලාභ ආන්තිකය | 44.33 | 55.32 |
| ලකුණු කළ ලාභය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 79.63 | 123.81 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 38.81 | 39.96 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 12.25 | 11.96 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 2.54 | 2.29 |
| ජංගම අනුපාතය | 1.59 | 2.46 |
| ක්ෂණික අනුපාතය | 0.89 | 2.05 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | (13) | 35 |
| තෝලන අනුපාතය | 14 | 18 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලකුණු කළ ලාභය පිළිවෙලින් සියයට 10.99 කින් හා සියයට 44.18 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිරිවැටුම මත පරිපාලන පිරිවැය සහ විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය සුළු වශයෙන් අඩුවී තිබුණි. තෝලන අනුපාතය සියයට 18 සිට සියයට 14 දක්වා අඩුවී තිබියදී යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය සියයට 48 න් අඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාගමේ පරිපාලිතයන් වන ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම (පෙර බිස්නස් ලංකා ඒඑන් (පුද්ගලික) සමාගම ලෙස හඳුන්වන ලද) සහ ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගම (පෙර ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගම ලෙස හඳුන්වන ලද) 2018 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් එකතු අලාභ රු. 25,884,625 ක් සහ රු. 13,139,185 ක් ලබා තිබුණි. මෙම පරිපාලිතයන් සම්පූර්ණයෙන්ම සමාගම මත රැඳුණු අතර ඒ හේතුවෙන්, පිළිවෙලින් රු. 22,534,489 ක් සහ රු. 10,594,185 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතුව පැවතුණි. තවද, අඛණ්ඩ ව්‍යාපාර අලාභ, සෘණ කාරක ප්‍රාග්ධනය සහ සෘණ නුබුන්වත් ආන්තිකය හේතුවෙන් 2018 පෙබරවාරි 15 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම පරිපාලිතයන් වසා දැමීමට තීරණය කර තිබුණි. | අඛණ්ඩ අලාභ, සෘණ කාරක ප්‍රාග්ධනය සහ සෘණ නුබුන්වත් ආන්තිකය හේතුවෙන් කළමනාකරණය විසින් මෙම පරිපාලිතයන් දෙකෙහි ව්‍යාපාරික මෙහෙයුම් නවතා දැමීමට තීරණය කර තිබුණි. | කළමනාකරණය විසින් පරිපාලිතයන් එහි අරමුණු ඉටුකර ගන්නා පරිදි මෙහෙයවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) 1985 දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ නියැලීම සඳහා පිහිටුවන ලද ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම මේ දක්වාම මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් කිසිදු මුදල් ප්‍රවාහයක් උපයා නොතිබුණි . | ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම සමාගමේ පරිපාලිතයක් වන අතර 1985 සිට ක්‍රියාත්මක නොවෙමින් පවතී. | ක්‍රියාත්මක නොවන ආයතන සම්බන්ධයෙන් තීරණයක් ගතයුතුවේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට රු.6,748,171 ක වටිනාකමකින් යුක්ත අගරු චෙක්පත් 151 ක් විය. ඉන් රු.1,981,878 ක වටිනාකමකින් යුක්ත චෙක්පත් 66 ක් සහ රු.1,279,588 ක වටිනාකමකින් යුක්ත චෙක්පත් 27 ක් පිළිවෙලින් වර්ෂ 5 කට සහ වර්ෂ 3 කට වඩා හිඟ හි පැවති ඒවා විය. | සටහන් කර ගන්නා ලදී. අගරු චෙක්පත් අඩුකිරීම සඳහා අප විසින් දැඩි ණය පාලන සහ අයකිරීම් ක්‍රියාවලියක නිරතව සිටින අතර අගරු චෙක්පත් හේතුවෙන් ඇතිවන හිඟ ශේෂ අයකර ගැනීමට උචිත පටිපාටි නිරන්තරව පවත්වාගෙන යයි. | පවත්නා පද්ධතිය ක්‍රමානුකූලව අධීක්ෂණය කළයුතුවේ. |
| (ඈ) සමාගම ලංකා පුවත්පත් සමාගමේ - ශ්‍රී ලංකාවේ ජාතික පුවත් නියෝජිතායතනය කොටස් 1200 ක් මිල දී ගැනීමට 2008 දෙසැම්බර් අතුරු ගෙවීමක් ලෙස රු . මිලියන 1.2ක් ගෙවා තිබුණ ද, 2018 දෙසැම්බර් 31 දින වනතෙක් ද කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. තවද , ලංකා පුවත් සමාගමට අදාළ සේවකයන් තුන්දෙනෙකුට 2017 වර්ෂය තුළ වැටුප් සහ වේතන වශයෙන් ගෙවූ රු. 2,151,146 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ලැබිය යුතු ලෙස පෙන්වා තිබුණි . | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ එල්කේපීබී 202.17 අනුව ඒඑන්සීඑල් ලංකා පුවත්පත් සමාගමේ කොටස් 1200 ක ආයෝජනය කර ඇත. සේවකයන් දෙදෙනෙක් දැනටමත් ඉල්ලා අස්වී ඇති අතර එක් සේවකයෙක් 2018 වර්ෂයේදී ඒඑන්සීඑල් සේවක සංඛ්‍යාවට එකතු වී ඇත. | ප්‍රතිලාභ ජනනය වෙන අයුරින් ආයෝජන සිදුකළ යුතුවේ. |
| (ඉ) ඔවුන් සමග ගනුදෙනු කළ අදාළ උපකාරක ලියවිලි අස්ථානගත වීම හේතුවෙන් , දින 720 ට වඩා හිඟ හිටි රු. 4,552,559 ක් වටිනා ණයගැතියන් හතර දෙනෙකුට එරෙහිව සමාගමට ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වී | සටහන් කර ගන්නා ලදී. මෙවැනි ගැටළු අනාගතයේ ඇතිවීම වැළැක්වීම පිණිස සහ ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ලේඛණ භාරකාරත්වය සම්බන්ධයෙන් වගකීම් ස්ථාපිත කළයුතුවේ. |

| | | |
|---|---|---|
| තිබුණි . | | |
| (ඊ) 2014 වර්ෂයේදී සමාගම "බුදුසරණ" වාර සඟරාවේ පිටපත් 192,665 ක් රජයේ ආයතනයකට නිකුත්කර තිබුණි. මෙම පිටපත්වල වටිනාකම රු.2,209,560 ක් විය. කිසිදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයකින් තොරව, සමාගම 2015 සිට අඩමාන ණයගැතියන් සඳහා සම්පූර්ණ වෙන්කිරීම් සිදුකර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනවන විට ද ශේෂය හිඟව පැවතුණි. | නිවැරදි කිරිමට සහ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ඇත. | හිඟයන් අයකර ගැනීමට අඛණ්ඩව උත්සාහ ගතයුතුවේ. |
| (උ) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගණනය කිරීමකින් තොරව රු.656,115,000 ක් වූ අවසාන තොගය පිරිවැයට අගය කර තිබුණි. | සියළුම තොග වෙළඳ තොග නොව පාරිභෝගික ද්‍රව්‍ය වේ. එබැවින්, තක්සේරුගත විකුණුම් මිල අප සැලකිල්ලට ගන්නේ නැත. සමාගම පිරිවැය මත පදනම්ව තොග අගය කරයි. | පාරිභෝගික ද්‍රව්‍ය සඳහා වුවද පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට අගය කිරීම සිදුකළ යුතුය. |
| (ඌ)වගකීම් නිශ්චිත ලෙස නිරවුල් කළ හැකි සාධාරණ තක්සේරුවක් ගණනය කිරීමකින් තොරව සමාගමට විරුද්ධව පවරා තිබුණු නඩු සඳහා සෑම වර්ෂයකම අවල රු.20,000,000ක වෙන්කිරීමක් සිදු කර තිබුණි. | නඩු සඳහා වෙන්කිරීමේදී සාධාරණ තක්සේරුවක් සිදුකර භාවිතා කර ඇත. | සාධාරණ තක්සේරුවකට එළඹීමට පෙර විසඳීමට තිබෙන නඩු එකින් එක සඳහා ඉල්ලා තිබෙන මුදල විශ්ලේෂණය කළයුතුවේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂය තුළ දී ප්‍රකාශයට පත්කරන ලද වර්ග 06 ක පුවත්පත් සහ වර්ග 12 ක වාර සඟරාවලට සාපේක්ෂව සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ වර්ග 07 ක පුවත්පත් සහ වර්ග 10 ක වාර සඟරා ප්‍රකාශයට පත් කර තිබුණි. සමාගම ''රැස'' නම් වූ පුවත්පත 2018 දී අලුතින් හඳුන්වා දී තිබුණු අතර "සිත්මිණ", "මිහිතුර" සහ "දැනමුතු" නමින් වූ වාර සඟරා තුන පහළ පාඨක ආකර්ශණය හේතුවෙන් නවතා දමා තිබුණි. තව ද, "සත්මඬල" නම් වූ වාර සඟරාව 2018 දී අලුතින් හඳුන්වා දී තිබුණි. | ඉදිරි වසර තුන සඳහා වූ ලේක්හවුස් සංයුක්ත උපක්‍රමික සැලැස්මේ නිර්දේශ මත ''රැස'' නම් වූ දිනපතා පුවත්පත දියත් කරන ලදී. පුවත්පත් සඳහා වූ පාඨක ගහණය අඩුවෙමින් පැවතීම හේතුවෙන් ප්‍රකාශණය සඳහා තරුණ පාඨක සමූහය ආකර්ශණය කර ගැනීමට ද පුවත්පත දියත් කරන ලදී. "සත්මඬල" සඟරාව ශ්‍රී ලංකා ටෙලිකොම් අනුග්‍රහ පැකේජයක් යටතේ හඳුන්වා දෙන ලදී. | සමාගම ඉහළ පාඨක ආකර්ශණයක් ලබාගැනීමේ හැකියාවන් පිළිබඳව ඇගයීම් සිදු කළයුතුය. |
| (ආ) ප්‍රධාන පුවත්පත් හයෙන් පිටපත් 1,419,821 ක් ද, අලුතින් හඳුන්වා දෙන ලද ''රැස'' නම් වූ පුවත්පතින් පිටපත් 126,772 ක් ද වශයෙන් 2018 දී නොමිලේ නිකුත් කරන ලද එකතු මුළු පිටපත් සංඛ්‍යාව 1,546,593 ක් විය. තවද, නොමිලේ නිකුත් කරන පදනමින් 2018 දී වාර සඟරා පිටපත් 88,090 ක් නිකුත් කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2018 දී සමස්ත නොමිලේ නිකුත් කරන ලද පිටපත් සංඛ්‍යාව 187,681 න් හෙවත් සියයට 13 න් වර්ධනය වී තිබුණි. මෙම පිටපත් සංඛ්‍යාව හා බැඳුණු පිරිවැය රු.109,142,884 ක් විය. | ආරම්භයේ දී නොමිලේ නිකුත් කරන ලද ''රැස'' පුවත්පතේ බෙදාහැරීම, වෙළඳපලේ පුවත්පත ප්‍රචලිත කිරීම සඳහා සිදුකරන ලදී. පුවත් ආවරණය වඩා නිදහස් සහ අන්තර්ගතයේ ගුණත්වය ඉහළ දැමීම සඳහා ලේක්හවුස් හි සියලු පුවත්පත් සඳහා ද වෙනස්කම් සිදුකරන ලදී. ඒ හේතුවෙන්, සංස්ථාපිත අංශයන් සහ අනාගත දැන්වීම්කරුවන් වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩි ප්‍රචාරණ ක්‍රියාකාරකම් ප්‍රමාණයක් සංවිධානය කරන ලදී. | නොමිලේ නිකුත් කරන පිටපත් ලැබෙන පාර්ශවයන් කාලානුරූපව යාවත්කාලීන කළයුතු අතර අඩුකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් 7 න් සහ වාර සඟරා 10 න් නොවිකිණී ආපසු ලද සමස්ත පුවත්පත් පිටපත් සංඛ්‍යාව 4,433,869 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 40 ක වැඩිවීමක් වී තිබුණි. නිශ්පාදනයෙන් ආපසු ලැබීම් සියයට 27 ක් නියෝජනය කරමින්, 2018 දී අලුතින් හඳුන්වා දුන් ''රස'' පුවත්පතෙන් ඉහළම නොවිකිණී ආපසු ලද පුවත්පත් සංඛ්‍යාව වාර්තා වී තිබුණි. | සියලු විකුණුම් මධ්‍යස්ථානවල පත්‍රය ලබාගැනීමට හැකිවීම පිණිස ''රස'' හඳුන්වා දීමෙන් පසු මුල් මාස කිහිපය තුළ දී අමතර පිටපත්, පුවත් නියෝජිතයන්ට යවන ලදී. පුවත්පත් සඳහා වූ තත්‍ය ඉල්ලුම නිවැරදිව ඇස්තමේන්තු කළ නොහැකි බැවින් ඕනෑම පුවත්පතක් අලුතින් හඳුන්වා දීමේදී මෙය සම්මත පුරුද්ද වේ. ආරම්භක අවධියේ වූ සියයට 50 ක ආපසු ලැබීම් වර්තමානයේදී සියයට 17 සිට සියයට 18 දක්වා පහළ ගොස් ඇත. | නොවිකිණී ආපසු ලැබෙන පිටපත් සංඛ්‍යාව අඩුකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඈ)2018 වර්ෂය තුළ දී සන්ඩේ ඔබ්සවර්, ඩෙයිලි නිවුස්, දිනමිණ සහ සිළුමිණ පුවත්පත්වලට අදාළව අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාව සියයට 5 සිට සියයට 12 ක පරාසයකින් අඩු වී තිබුණි. කෙසේවුවද, තිනකරන් සහ වාරමංජරී අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාවේ පිළිවෙලින් සියයට 3 ක සහ සියයට 4 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. "තරුණි" ,"මංචු" සහ "සුබසෙත" නම් වූ වාර සඟරාවල ද සියයට 9 සිට සියයට 11 ක් දක්වා වූ පරාසයකින් අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. | කර්මාන්තය තුළ සමස්ත පුවත්පත් අලෙවියේ අඩුවීමක් ඇත. 2018 අවසන් කාර්තුවේ මුද්‍රණය කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ද වෙළඳපලට පුවත්පත් ප්‍රමාද වී ලැබී අලෙවිය අඩුවීමට හේතුවිය. වාර සඟරා තුනක විකුණුම් මිල ගණන් ඉහළ දැමීම ද අලෙවියේ තරමක අඩුවීමකට හේතු විය. | ඉහළ පාඨක ආකර්ශණයක් ලබාගැනීමේ හැකියාවන් පිළිබඳව සමාගම ඇගයීම් සිදු කළයුතුය. |
| (ඉ) අලුතින් හඳුන්වා දෙන ලද ''රස'' පුවත්පතෙන් ලද අලෙවි ආදායම නොසලකාහැරි විට, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දී, පුවත්පත් 6 න් ලද ආදායම සියයට 3 න් අඩුවී තිබුණි. කෙසේවුවද, 2018 දී සමාගම විසින් පුවත්පත් 4 ක විකුණුම් මිල ගණන් ඉහළ දමා තිබුණි. | මුද්‍රණ ගුණත්වය ඉහළ දැමීමට සහ දැන්වීම් ආදායම් ඉහළ දැමීමට ප්‍රධාන පුවත්පත් ගොස් මැග්නම් ප්‍රෙස් මඟින් මුද්‍රණය කිරීමට කළමනාකරණය තීරණය කර තිබුණි. මෙයට පහසුවක් පිණිස පුවත්පත් මුද්‍රණය සඳහා ගොස් මැග්නම් ප්‍රෙස් හි ධාරිතාවය ඉහළ දැමීමට ද, වෙනත් විකල්පයක් හෝ නව | ඉහළ පාඨක ආකර්ශණයක් ලබාගැනීමේ හැකියාවන් පිළිබඳව සමාගම ඇගයීම් සිදු කළයුතුය. |

| | | |
|---|---|---|
| | මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට හැකියාවක් නොමැතිවීම නිසා වාණිජ මුද්‍රණ කටයුතු නැවැත්වීමට ද තීරණය කරන ලදී. | |
| (ඊ)ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2018 දී වාණිජ මුද්‍රණ අංශය, විශේෂ ප්‍රකාශන සහ ඩිජිටල් මුද්‍රණයන්ගේ ආදායම පිළිවෙලින් සියයට 13 ක්, සියයට 21 ක් සහ සියයට 63 ක් වශයෙන් අඩු වී තිබුණි. | කළමනාකරණය ප්‍රධාන පුවත්පත් ගොස් මැග්නම් ප්‍රෙස් මඟින් මුද්‍රණය කිරීමට තීරණය කර තිබුණි. මෙයට පහසුවක් පිණිස පුවත්පත් මුද්‍රණය සඳහා ගොස් මැග්නම් ප්‍රෙස් හි ධාරිතාවය ඉහළ දැමීමට ද, වෙනත් විකල්පයක් හෝ නව මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට හැකියාවක් නොමැතිවීම නිසා වාණිජ මුද්‍රණ කටයුතු නැවැත්වීමට ද තීරණය කරන ලදී. | උපරිම ප්‍රතිලාභ ලබාදෙන ව්‍යාපෘති පිළිබඳව තාර්කිකව ඇගයීම් කළ යුතුවේ. |
| (උ)වැඩි දැන්වීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා සමාගම දැන්වීම් / අලෙවි කළමනාකරුවන්ට දිරිදීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබුණ ද, ''රස'' පුවත්පතෙන් ලද දැන්වීම් ආදායම හැර සමස්ත දැන්වීම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.6,357,000 න් අඩුවී තිබුණි. තවද, 2018 ජුනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම "ඩෙයිලි නිවුස්", "දිනමිණ" "තිනකරන්" සහ "වාරමංජරි" හි සාමාන්‍ය දැන්වීම්වල ගාස්තු ඉහළ දමා තිබුණි. | 2018 සැප්තැම්බර් තෙක් සමස්ත දැන්වීම් ආදායම ඒ හා සමාන ඉකුත් කාලච්ඡේදයේ ආදායමට වඩා වැඩි විය. වර්ෂයේ අවසන් කාර්තුවේ දැන්වීම් ආදායම සාමාන්‍යයෙන් ඉහළයාමේ ප්‍රවනතාවයක් පවතින බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වර්ෂ අවසානයේදී අවම වශයෙන් 5% ක වර්ධනයක් ළඟාකරගැනීමට හැකිබවට අපට විශ්වාශයක් තිබුණි. කෙසේවුවද, 2018 ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් දැන්වීම් ආදායම රටේ නොවිසඳුණු දේශපාලන තත්වයන් හේතුවෙන් දැඩිලෙස බලපෑමට ලක්වීමෙන් අඩුවිය. | පුවත්පත් සහ වාර සඟරා සඳහා වෙළඳපල කොටස වැඩිකර ගැනීමේ මාර්ග පිළිබඳව සහ දැන්වීම් ආදායම වැඩිකර ගැනීම පිළිබඳව කළමනාකරණය ඇගයීම් කළ යුතුවේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබුණු හෝකන්දර පිහිටි අක්කර 8ක ඉඩම 1985 ,සිට නිෂ්කාර්යව පැවතුණි. | පිළිගන්නා ලදී. 2013 දී හෝකන්දර ඉඩමේ අයිතිය ඒඑන්සීඑල් වෙත මාරු කරන ලද අතර 2016 වීආර්එස් සඳහා සහ කාරක ප්‍රාග්ධනය සඳහා කොමර්ෂල් බැංකුව වෙත උකස්කර ඇත. | දේපළක් ඇපයක් ලෙස තැබීම බාධාවක් නොවේ. සමාගම ප්‍රතිලාභ ජනිත වෙන ලෙස මෙම වත්කම උපයෝජනය කළයුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012 ජුලි 01 දින සකස්කර තිබුණු සේවක ලැයිස්තුව වෙනුවට සමාගම 2017 ජුනි 06 දින සේවක ලැයිස්තුවක් පිළියෙල කර තිබුණි. කෙසේවුවද, 2019 මැයි 13 දින වන විට ද, සේවක ලැයිස්තුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, 2017 පිළියෙල කරන ලද සේවක ලැයිස්තුව අනුව, සාමාන්‍ය සහ කර්තෘ මණ්ඩල සේවක ලැයිස්තුව පිළිවෙලින් 658 ක් සහ 327 ක් විය. කෙසේවුවද, 2018 දෙසැම්බර් 31 දින වන විට සාමාන්‍ය සහ කර්තෘ මණ්ඩල තත්‍ය සේවක සංඛ්‍යාව (කොන්ත්‍රාත් පදනමින් වූ සේවකයින් 468 ක් ද ඇතුළුව) පිළිවෙලින් 1088 ක් සහ 558 ක් විය. | සැලසුම් කරන ලද හා ක්‍රියාත්මක කරමින් පවතින ස්වයංක්‍රීයකරණය සහ පද්ධතිවලින් (ඊආර්පී, විකුණුම්, අයිටී පද්ධති, ජාල වැඩිදියුණු කිරීම්,එච්ආර්අයිඑස් පද්ධති ආදී) ගොඩනැගෙන කාර්යක්ෂමතාවය සැලකිල්ලට ගැනීමෙන් සහ ලේක්හවුස් හි සංවර්ධනය කරමින් පවතින උපක්‍රමික සැලැස්ම පදනම් කරගෙන කළමනාකරණය විසින් 2017/06/06 දිනට යෝජිත සේවක ලැයිස්තුව, කර්තෘ මණ්ඩල- 327, සාමාන්‍ය පරිපාලන - 658 පිළියෙල කර ඇත. අඩුකිරීම තුළින් මෙම සේවක ගණනට තිරසර අයුරින් ළඟාවීම සඳහා ලේක්හවුස් වෙත වසර දෙකක් හෝ ඊට වැඩි ගණනක් ගතවිය හැකිය. සභාපති විසින් මෙම සේවක ලැයිස්තුව අනුමත කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ)යහපත් කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා කුසලතා අත්කර ගැනීම , උසස් කිරීම ,නිවාඩු ප්‍රතිපත්ති, කාර්යසාධන කළමනාකරණය ආදී වශයෙන් වූ ප්‍රතිපත්ති හතක් සමාගම විසින් සකස් කර තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විට කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තියට පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි . | මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති හතෙන් ''කාර්යසාධන කළමනාකරණ'' ප්‍රතිපත්තිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. තවද, අනුමත නොකරන ලද ප්‍රතිපත්ති මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කෙරෙමින් පවතින අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | සියලුම ප්‍රතිපත්ති සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) බඳවාගැනීම් සහ උසස් කිරීම් ආයතනයක යථාරූපී සේවක ලැයිස්තුවේ තනතුරු සමඟ ක්‍රමානුකූලව ගැලපිය යුතුය. කෙසේවුවද, සමාගම 2018 දෙසැම්බර් 31 දින වන විට ඔවුන්ගේ රැකියා තනතුරු අනුව තත්‍ය සේවකයින් වර්ගීකරණය කිරීමට අපොහොසත් වී තිබුණි. | අපගේ ප්‍රකාශනවල ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන යාම සඳහා සමහර දෙපාර්තමේන්තුවල විශේෂයෙන් කර්තෘ අංශයේ අවශ්‍යතා පදනම් කරගෙන සමහර සේවකයන් කොන්ත්‍රාත් පදනමින් පත්කර තිබුණි. | රැකියා වර්ගීකරණය අනුව තත්‍ය සේවක සංඛ්‍යාව වර්ගීකරණය කිරීමට සමාගම පද්ධතියක් හඳුන්වාදිය යුතුය. |
| (ඇ) තනතුරු සඳහා වයස් සීමාවන්, බඳවාගැනීමේ මාධ්‍යය (බාහිර දැන්වීම්/ අභ්‍යන්තර දැනුම්දීම් සහ ලිඛිත ඇගයීම්/සම්මුඛ පරීක්ෂණ) සමාගමේ බඳවාගැනීම් පටිපාටියේ ඇතුළත් කර නොතිබුණි. | තනතුරු සඳහා බාහිරව දැන්වීම් පළකරන විට සහ එක් එක් සහ සියලුම තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ සිදුකරන අවස්ථාවල හා අවශ්‍යතා මත පදනම්ව සමහර තනතුරු සඳහා ලිඛිත පරීක්ෂණ පවත්වනවිට වයස් සීමාව දැන්වීමේ සඳහන් කරනු ලැබේ. | බඳවාගැනීමේ පටිපාටිය අවශ්‍ය තොරතුරුවලින් සමන්විත විය යුතුය. |
| (ඉ) සමාගමේ අතිරික්ත සේවකයින් අඩුකිරීම සඳහා 2008, 2010, සහ 2016 දී ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාක්‍රමයක් (වීආර්එස්) හඳුන්වා දී සේවකයින් 991 ක් මෙම යෝජනාක්‍රමය යටතේ සමාගමෙන් ඉවත් වුවද, 2008 සැප්තැම්බර් 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින වන විට සේවකයින් 598 ක් අලුතින් බඳවාගෙන තිබුණි. | ඉංග්‍රීසි පුවත්පත්වල ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන යාමට සහ සමාජ මාධ්‍යයන්හි නව තාක්ෂණික සොයාගැනීම්වල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නව ප්‍රකාශණ හඳුන්වාදීමත් සමඟ (රැස, අමාත්‍යාංශ සමඟ පළකරන කුඩා පුවත්පත්) කළමනාකරණයේ අභිමතය පරිදි විශේෂයෙන් කර්තෘ දෙපාර්තමේන්තුව සඳහා සමහර සේවකයින් කොන්ත්‍රාත් පදනමින් පත්කර තිබුණි. | වීආර්එස්වලින් පසුව ද අඛණ්ඩව සේවකයින් බඳවාගෙන ඇති බැවින් වීආර්එස් තාර්කික පදනමින් යොදා ගතයුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**-------------------------------------**

**4.1** **විගණන කමිටුව**

**-------------------**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විගණන කමිටුව අවම වශයෙන් විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත යුතු අතර භාණ්ඩාගාර නියෝජිතයකු හෝ මූල්‍ය කළමනාකරණ කුසලතා දරන පුද්ගලයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතු වුව ද, එම රැස්වීම් වලට භාණ්ඩාගාර නියෝජිතවරයෙකු සහභාගී වී නොතිබුණු අතර විධායක අධ්‍යක්ෂකවරයෙකු සභාපතිත්වය දරා තිබුණි . | සටහන් කර ගන්නා ලදී. | විගණන කමිටුව අදාළ සේවක මණ්ඩලයකින් සමන්විත විය යුතුය. |